# Impact of the Kandyan Convention signed by the United Kingdom on Sri Lanka on the contemporary domestic economy

## Abstract

The Kandyan Convention was a consensus between the British colonial government and Kandian Chieftains. However, the convention set the stage for the full transformation of the old traditions. Especially during the last few decades, it has completely changed the political, social, economic and cultural process of the society. This change has since been felt by the people of Sri Lanka in a very hard manner, and the foundation has been created to create various kinds of stress among Sri Lankans. In particular, the traditional economic pattern of the feudal political system that had existed in the past has completely broken down. Instead of conventional subsistence measures, the people had to turn into new methods. Non-productive products and socioeconomic procedures were introduced to the Sri Lankan society. The aim of this review is to look at the impact of the Kandyan Convention on the local economy.

## උඩරට ගිවිසුම මගින් ශ්‍රී ලංකාවේ තත්කාලීන දේශීය ආර්ථිකයට සිදුවූ බලපෑම

මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි

*'ක්‍රිස්තු වර්ෂයෙන් වර්ෂ එක්වාදහස් අටසිය පහලොහක් වූ මාර්තු මස දෙවෙනි දින නොහොත් සිංහල වර්ෂ ප්‍රමානයෙන් ශකවර්ෂ එක්වාදහස් සත්සිට් තිස් හයට පැමිනි අවුරුද්දෙ නවම් මස අවසතවත් නම් තිථිය ලත් ගුරුදින සෙංඛඩශෛලාභිධාන පුරපුවරයෙහි........*'[1]

යනුවෙන් ආරම්භ ව උඩරට ප්‍රධානීන් සහ මෙරට ඉංග්‍රීසි ආණ්ඩුකාරවර රොබට් බ්‍රවුන්රිග් විසින් අත්සන් කරන්නට යෙදුන වගන්ති දොළසකින් යුතු වූ ලේඛනය උඩරට ගිවිසුම නමින් හැඳින්වේ. මෙම ගිවිසුමත් සමඟ වසර දෙදහස් දෙසියකට වැඩි කාලයක් පුරා පැවති මෙරට රාජාණ්ඩු පාලනය සම්පූර්ණයෙන් ම අවසන් විය.

උඩරට ගිවිසුම යනු ප්‍රභූ දෙපිරිසක් අතර ඇතිකරගත් එකඟතාවයක් වුවද එය මෙරට තුළ එතෙක් පැවති සම්ප්‍රදායන් පූර්ණ වශයෙන් ම වෙනස් කරලීමට පසුබිම සැකසීය. විශේෂයෙන් ම අනාදිමත් කාලයක් පුරා ශ්‍රී ලාංකේය සමාජය තුළ පැවති දේශපාලන, සමාජ, ආර්ථික සහ සංස්කෘතික ක්‍රියාවලිය පූර්ණ වශයෙන් ම වෙනස් කරලීමට හේතු විය. එම වෙනස එතැන් සිට ඉතා ප්‍රබල ආකාරයෙන් මෙරට ජන සමාජය වෙත දැනෙන්නට වූ අතර එය ශ්‍රී ලාංකේය ජනතාව අතර

[1] අබයසිංහ. ටී, දේවරාජ. එස්, සෝමරත්න. ජී.පී.වී., 2015, ***උඩරට රාජධානිය 1470-1818***, සී/ස ස්ටැම්ෆර්ඩ් ලේක් සමාගම, පන්නිපිටිය, පි. 160 සිට

නොයෙකුත් ආකාරයේ පීඩනකාරී තත්ත්වයන් ඇතිකරලීමට පදනම සැකසී ය. විශේෂයෙන් ම එතෙක් පැවති වැඩවසම් දේශපාලන ක්‍රියාවලිය තුළ ගොඩනැගුණු සාම්ප්‍රදායික ආර්ථික රටාව මෙමගින් පූර්ණ වශයෙන් ම බිඳ වැටීමකට ලක්වී තිබේ. සාම්ප්‍රදායික යැපුම් ක්‍රියා මාර්ග වෙනුවට නව ක්‍රමවේද වලට යොමුවීමට ජනතාවට සිදු විය. ලාංකේය සමාජයට නුහුරු නිෂ්පාදන, සමාජ ආර්ථික ක්‍රියාපිළිවෙත් මෙරට සමාජය වෙත ගොනු විය. මෙම විමර්ශනය මගින් ඉදිරිපත් කරලීමට අපේක්ෂා කරනු ලබන්නේ උඩරට ගිවිසුම මගින් දේශීය ආර්ථිකයට සිදුවූ බලපෑම සම්බන්ධයෙනි.

## විමර්ශනය

දේශපාලනික බලය පිළිබඳ ව ඇති වූ අවිශ්වාසය, බුදු දහම හා භික්ෂු පරපුරට හිමි වූ සමාජ ගෞරවය අඩුවීම සහ දේශීය ආර්ථිකය වෙනුවට ආගන්තුක ආර්ථික ක්‍රියාවලියක් ගොඩනැගීම පැවති අපහසුතාවය 1818 මහා කැරැල්ල ඇතිවීමට හේතු විය. මෙම කැරැල්ල පොදු ජනතාවගේ කැරැල්ලක් ලෙස හැඳින්වීමට හේතු වූ ප්‍රධාන කාරණය වන්නේ ප්‍රභූ යැයි සම්මත ඉහළ රදළ පැලැන්තියේ ජන පිරිස් මෙන් ම පහළම සමාජ ස්ථරයේ ජනතාව ද එකම ආකාරයෙන් තම දායකත්වය ලබාදීමට කටයුතු කළ කැරළි නායකයින් අතර සිටීමෙන් තහවුරු වේ. ඒ අනුව මෙම කැරැල්ල බලෙන් එල්ලකරන ලද ජන නැගිටීමක් නොවන බවට අර්ථ ගැන්වීමට පුළුවන.

වර්ෂ 1814 මාර්තු මාසයේ දී එක්නැලිගොඩ හමුවූ ජෝන් ඩොයිලි ප්‍රකාශ කර සිටින ලද්දේ ප්‍රදේශ ලාභය හා රාජ්‍ය ව්‍යාප්තිය බ්‍රිතාන්‍යයන්ගේ අරමුණ නොවන බවකි. බ්‍රිතාන්‍ය රාජ්‍ය නියෝජනය කළ උසස් නිලධාරියෙකු වූ ඩොයිලිගේ මෙම ප්‍රකාශය උඩරට රදළවරුන් දැඩි ලෙස විශ්වාසය කරන ලද අතර 1815 ජනවාරි ප්‍රකාශයේ ද එවැනි අදහසක් ඍජුව ප්‍රකාශ වී නොමැත.[2] මීට අමතර ව ඇතැම් ඉංග්‍රීසි හමුදා නිලධාරීන් ඇහැලෙපොල අදිකාරම වඩාත් උසස් ස්ථානයක ලා සැලකීමට කටයුතු කරන ලදි.[3] මෙවැනි සිදුවීම් තුළ උඩරට රදළවරුන් පමණක් නොව සාමාන්‍ය ජනතාව ද විශ්වාස කරන ලද්දේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බලයෙන් ඉවත් කොට නැවත උඩරට රාජධානියේ බලය තමන්ට ලබාදෙනු ඇති බව ය. එය ඉටු නොවන බව රදළවරුන්ට, භික්ෂූන්ට ක්‍රමයෙන් වැටහී යන විට ඔවුහු ප්‍රාදේශීය වශයෙන් කටයුතු කළ නායකයින්ට තම කළකිරීම දැනුම් දුන් අතර ඒ ඔස්සේ එය සාමාන්‍ය ජනතාව වෙත ප්‍රවේශ විය. මෙම තත්ත්වය තුළ කළකිරීමට පත්ව සිටි සිංහල ජනතාව කැරැල්ලකට සමීප කිරීමට ඇතැම් මුස්ලිම් ප්‍රධානීන් ඉංග්‍රීසින් සමඟ කළ රහසිගත කටයුතු ඉවහල් විය.

උඩරට ගිවිසුම ඉංග්‍රීසි ආණ්ඩුව සහ මෙරට පරිපාලන ප්‍රභූ අතර ඇතිකරගත් ගිවිසුමක් වුවද එහි බලපෑම තත්කාලීන ශ්‍රී ලාංකේය සමාජයේ සෑම ක්ෂේත්‍රයකට ම එකසේ බලපාන ලදි. එහෙත් ඒ බව

---

[2] අබයසිංහ. ටී, දේවරාජ. එස්, සෝමරත්න. ජී.පී.වී., 2015, පි. 126
[3] Pieris P.E., ***Sinhale and the patrious 1815-1818***, p8

මෙරට ප්‍රභූන්ට අවබෝධ වූයේ එය ක්‍රියාත්මක වී වසරක පමණක කාලයක් ගතවූ පසුව ය. උඩරට ගිවිසුම ඉදිරිපත් කිරීම තුළින් බ්‍රිතාන්‍යයින් බලාපොරොත්තු වූයේ මෙරට තුළ ඔවුන්ගේ පැවති ආධිපත්‍ය සඳහා නීත්‍යානුකූල භාවයක් ලබාදීම ය. එහෙත් එය උඩරට ප්‍රභූන්ගෙන් වසන් කළ බවක් ගිවිසුම පිරික්සීමේ දී පැහැදිළි වේ. එහි පළමු වගන්තිය උඩරට රජු දේශීය ජනතාවගේ අයිතිවාසිකම උල්ලංගනය කළ බව සඳහන් කර ඒ නිසා ඔහු බලයෙන් පහකොට එම පරම්පරාවන්ට හිමි රාජකීය අයිතිවාසිකම් අවලංගු කළ බව සඳහන් කර තිබේ.[4] එමගින් නායක්කාර වංශික රජු කෙරෙහි මෙරට ජනතාව තුළ තිබූ අප්‍රසාදය ඉස්මතු කොට දක්වා ඒ නිසා ඔහුව සිහසුනෙන් නෙරපීමට කටයුතු කළ බව පෙන්වා දී තිබේ. එහි සිව්වන වගන්තිය තුළ මෙම ගිවිසුම ඇති කිරීමේ අභිප්‍රාය මැනවින් හඳුනාගත හැකි ය. ඒ අනුව උඩරට රාජ්‍ය බ්‍රිතාන්‍යයේ තුන්වන ජෝර්ජ් රජු හට පැවරීමට කටයුතු කළ බව සඳහන් කර තිබේ. ඒ අනුව ලංකා රාජ්‍ය පූර්ණ වශයෙන් බ්‍රිතාන්‍යයේ කිරුළ යටතට මෙම ගිවිසුම මගින් පත් කළ බව පැහැදිළි ය. මේ වන විට උඩරට රාජධානිය තුළ ක්‍රියාත්මකව සිටි දේශීය ප්‍රභූ පැළැන්තිය තාවකාලික වශයෙන් මුලාවකට ලක්කොට ඔවුන්ගේ අභිප්‍රායන් ඉටුකර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් එහි පස්වන වගන්තිය තුළ අදහසක් ලබාගත හැකි බව පැහැදිළි ය.[5] ඒ අනුව උඩරට ප්‍රභූන්ගේ නිලතල හා අයිතිවාසිකම් වරප්‍රසාද ආරක්ෂා කරලීමට ගිවිසුමෙන් පොරොන්දු වූ බව සඳහන් කොට ඇත. එමෙන් ම ජනතාව එතෙක් අනුගමනය කළ ජනසම්මත චාරිත්‍ර වාරිත්‍ර දේපළ අයිතිවාසිකම් ආදිය සුරැකෙන බවට කර තිබෙන ප්‍රකාශයෙනුත් බුදු දහමට හානියක් නොකොට වෙහෙර විහාර, භික්ෂූන් හා බෞද්ධාගමික චාරිත්‍ර වාරිත්‍ර ආරක්ෂා කරන බවට ද ගිවිසුමෙන් පොරොන්දුවක් ලබා දී තිබේ. එමෙන් ම සාම්ප්‍රදායික ව පැවති ජනතාවගේ නඩු විසඳීමේ ක්‍රම ආරක්ෂා කරලීමටත් එහෙත් මරණ දඬුවම ආණ්ඩුකාරවරයාගේ යටතට පවරා ගැනීමත් සිදුකර ඇත.[6]

මෙම වගන්තිවලින් දැක්වෙන කරුණු සම්බන්ධයෙන් මතුපිට අදහස උඩරට ප්‍රභූන්ට හා ජනතාවට වැටහීම නිසා ඔවුන් සිතන්නට ඇත්තේ උඩරට රජුගේ අණසක යටතේ පැවති දැඩි පීඩනකාරී තත්ත්වය ඉවත් වී ඔවුන්ට නිදහසේ කටයුතු කිරීමට හැකි වාතාවරණයක් සකස් වූ බව ය. විශේෂයෙන් ම ඔවුන් අනාදිමත් කාලයක සිට පවත්වාගෙන ආ සමාජ ආර්ථික හා සංස්කෘතික ක්‍රියාවලීන්ට එමගින් බාධාවක් සිදු නොවන බවට ඔවුන්ගේ විශ්වාසය විය. මේ නිසා මෙම ගිවිසුම රට නව මගකට යොමු කරන වඩාත් ඵලදායි ගිවිසුමක් ලෙස දේශීය වශයෙන් අත්සන් කරන ලද උඩරට ප්‍රභූන් විශේෂයෙන් ම සළකන්නට ඇති අතර, එය ඔවුන් විසින් සාමාන්‍ය ජනතාව වෙත ප්‍රකාශ කරලීම තුළ කිසියම් ආකාරයක තෘප්තිමත් බවක් රටවැසියා තුළ ගොඩනැගෙන්නට ඇති බව සිතිය හැකි ය. ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉංග්‍රීසින් විසින් අනුගමනය කළ ඇතැම් උපක්‍රමයන් ද ජනතාව තුළ විශ්වාසය ඇති කිරීමට හේතුවක් විය. ගිවිසුම අත්සන් කිරීමෙන් පසු එදිනම මල්වතු හා අස්ගිරි පාර්ශවයන්හි මහා නායක හිමිවරුන් හා භික්ෂූන් ආණ්ඩුකාරවරයා හමුවීම තුළ මෙම ගිවිසුම

[4] එම. පි. 121

[5] එම. පි. 161

[6] එම

භික්ෂූන් විසින් ද අනුමත කරන්නට ඇති බවට අදහසක් ප්‍රභූන් තුළ මෙන් ම ජනතාව අතර ද ගොඩනගන්නට තරම් ඉංග්‍රීසීන් උපක්‍රමශීලී ඇතිබව පෙනේ.[7]

කෙසේ වෙතත් මෙම ගිවිසුමේ වගන්ති සහ ඇතැම් ක්‍රියාමාර්ග තුළින් ලංකා රාජ්‍ය උපක්‍රමශීලීව බ්‍රිතාන්‍ය කිරුළ යටතට ගැනීමට කරන ලද සාර්ථක උත්සාහයක් බව පෙන්වා දිය හැකි ය. මේ බව උඩරට ප්‍රභූන්ට සහ ජනතාවට වැටහී යාමට තරමක කාලයක් ගත විය. 1815 ගිවිසුමෙන් පසු ලංකාවේ කන්ද උඩ රාජධානියේ පැවති රාජාණ්ඩු ක්‍රමය පූර්ණ වශයෙන් බිඳ වැටුණු අතර එතැන් සිට ක්‍රියාත්මක වූයේ ඉංග්‍රීසි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ වන නීතීන් ය. ඒ අනුව ලංකාවේ සාම්ප්‍රදායික නීතින් ක්‍රමයෙන් අවලංගු කිරීමටත්, ජනතාවගෙන් බැහැර කරලීමටත් හැකි වී තිබේ. **රොබට් රේ** පවසනු ලබන්නේ මෙම ගිවිසුම මගින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන පූර්ණ පරමාධිපත්‍ය බ්‍රිතාන්‍ය රජයට ලැබුණු බවයි.[8] කෙසේ වෙතත් **අයිවර් ජෙනිංග්ස්** ප්‍රකාශ කොට ඇත්තේ මෙම ගිවිසුම මගින් රටේ පරිපාලනයට නීතීන් සම්පාදනය කිරීමේ බලයක් බ්‍රිතාන්‍යයින් ලබා ගත් බවකි.[9] **ටිකිරි අබේසිංහ** පෙන්වා දෙනු ලබන්නේ ගිවිසුමක් සහිතව යටත්වීම හෝ රාජ්‍යය පවරාදීම අර්ථ විරහිත ක්‍රියාවක් ලෙසිනි. එය මෙරට ඉංග්‍රීසි පරිපාලකයින් කරන ලද වංචනික ක්‍රියාවන් බවත්, එය තමන්ට අභිමතය පරිදි වෙනස් කිරීමට බ්‍රිතාන්‍ය රජයට අවසරය පවතින හෙයින් එය කිසිදු වැදගත්කමක් නොමැති ලියවිල්ලක් වන බවත් ය.[10]

උඩරට ජනතාව නිරතුරුවම විදේශීය ජාතින් ප්‍රියකළ පිරිසක් නොවූ අතර විදේශිකයින් කිසිවෙකු මෙරට පාලනය කිරීම ප්‍රතික්ෂේප කළ පිරිසකි. නිදහස් සටන් මර්ධනය කරලීමට ඉංග්‍රීසින් සමත් වුවද ඉංග්‍රීසින් වෙනුවෙන් පැවැති පිළිකුල් සහගත තත්ත්වය වෙනස් කරලීමට ඔවුන්ට හැකියාවක් නොමැති විය. මේ හේතුවෙන් ඉංග්‍රීසින්ගෙන් නිදහස් වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට උත්සහා ගනිමින් සිටින අතරතුර ඉංග්‍රීසින් අනුගමනය කළ ජන හිතවාදී නොවන ක්‍රියාමාර්ග ඔවුන් කැරැල්ලකට යොමුකිරීමට හේතු විය. ඒ අතර ප්‍රබල සාධකයක් වූයේ ඉංග්‍රීසින් විසින් හඳුන්වා දෙනු ලැබූ නව ආර්ථික ක්‍රියාවලින් ජනතාවට ගෝචර නොවීම ය.

උඩරට රාජධානියේ බලය ඉංග්‍රීසින් විසින් පූර්ණ වශයෙන් අත්පත් කරගත් බවට ප්‍රධාන සාධකයක් ලෙස පෙන්වාදිය හැක්කේ මහනුවර රාජ්‍ය බාරව ස්ථිර නිලධාරියා ලෙස ජෝන් ඩොයිලි පත් කිරීම සහ ආදායම් බදු හා අධිකරණ කටයුතු උදෙසා කොමසාරිස්වරුන් දෙදෙනෙකු පත් කිරීම ය.[11] මීට අමතරව හමුදා කටයුතු සඳහා සේනාධිපතිවරයෙක් පත් කරන ලදි. මෙම තත්ත්වය උඩරට සහ තදාශ්‍රිත ජනතාවට වඩාත් හුරු පුරුදු වූ රාජාණ්ඩු ක්‍රමයට වඩා බෙහෙවින් වෙනස් වූ බැවින්

---

[7] සිල්වා. එම්. යූ. ද., 1996, ***ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශය හා ජාතික ව්‍යාපාරය 1802-1927***, කඩවත, පි. 85.

[8] Wray. Robert., 1966, ***Commonwealth and Colonial Law***, London, pp. 214-6.

[9] Jennings. I, Young. C.M., 1952, ***Constitutional Low of the Commenwelth***, Oxford, p.58.

[10] අබයසිංහ. ටී, දේවරාජ. එස්, සෝමරත්න. ජී.පී.වී., 2015, පි. 123

[11] බස්නායක, එච්.ටී., 2005, ***ශ්‍රී ලංකවේ ශිෂ්ටාචාරය - 03 ඉංග්‍රීසි පාලන සමය***, ගොඩගේ සහ සමාගම, කොළඹ, පි. 52.

උඩරට රදලයින්ට මෙන් ම ජනතාවට ද පීඩාකාරී ලෙසින් දැණුන දේශපාලනික වෙනස්කමක් විය. මේ වන විට උඩරට සහ එයට අයත් පාලන ප්‍රදේශවල ජනතාව හුරුවී සිටියේ රජුගේ විධායක බලය ඉන් පහළ නිලධාරින් ඔස්සේ ඔවුන් වෙත ලැබී ඒ අනුව කටයුතු කිරීමට ය. ඒ ආකාරයෙන් සැකසුණු ජීවන රටාවකට ද ඔවුන් හුරුවී සිටින ලදි. මෙම තත්ත්වය උඩරටින් බාහිරව පැවති සත්කෝරළය, වලපනේ ප්‍රදේශය හා ඌව වෙල්ලස්ස කලාපයන් හී වාසය කළ ජනතාවට වඩාත් තදින් දැනෙන්නට ඇත. රජු හා ඉන් පහළ තනතුරු හෙබවූ අධිකාරම්වරු, දිසාවේවරුන් ඇතුළු නිලධාරින්ගේ අණ සහ උපදෙස් නොලැබුණ විට රජෙකු නොමැති ව තමන් තනි වී අසරණ වූ ස්වභාවයක් ඔවුන්ට දැනෙන්නට ඇත. ඒ බව තත්කාලීන ජනතාවට විසින් ප්‍රකාශ කළ බවට සඳහන් වන,

| | | | |
|---|---|---|---|
| 1. අනේ කුහුඹිය | නේ | 2. රජෙක් ලැබුනෝ | තින් |
| තොපටත් රජෙක් | ඉන්නේ | එදා කිරිබත් කන් | නන් |
| මොකදෑ | කරන්නේ | පෙරහැර කරන් | නන් |
| අපේ කරුමේ අපට | වන්නේ | සාදු නාදෙන් ගිගුම් දෙන් | නන් |

යන පද්‍යයන්ගෙන් මැනවින් තහවුරු වේ.[12]

උඩරට රදළ ප්‍රධානීන් මෙන් ම මහජනතාව ද අළුතින් උඩරට ස්ථාපිත වූ බ්‍රිතාන්‍ය පරිපාලනයට විරුද්ධ විය. ඒ සඳහා ප්‍රධාන වූයේ ඔවුන්ගේ සිතැඟි නිසි ආකාරයෙන් තේරුම් නොගෙන ඉංග්‍රීසින් තම පාලන කටයුතු සිදුකරගෙන යාම ය. විශේෂයෙන් ම ඉංග්‍රීසින් රටේ සෑම ජන කණ්ඩායමකටම එක හා ලෙස නොසැළකීමත්, භික්ෂූන් වහන්සේලා සඳහා නිසියාකාර ගෞරවය නොදැක්වීමත් යන හේතූන් මත මෙම තත්ත්වය වඩාත් උග්‍ර විය. මහාචාර්ය බස්නායක පෙන්වා දෙන්නේ බොහෝ දුර බැහැර ප්‍රදේශයක සිටින වෙනත් රජෙකු පිළිබඳ හැඟීම මෙරට ජනතාවට ඇති නොවීම තුළ එතෙක් මහනුවර රජුට දැක් වූ ගෞරවය නව රජු වෙත පිළිගැන්වීමට මෙරට ජනතාව අකමැත්තක් දැක් වූ බවයි.[13] කන්ද උඩරට ජනතාවට අවශ්‍ය වී තිබී ඇත්තේ ඔවුන්ගේ ඉල්ලීම්, දුක් ගැහැට පිළිබඳ ව ඇහුම්කන්දෙන නව රජ කෙනෙකු විය. එසේ නොමැති වීම උඩරට රාජධානිය නිමාවීමෙන් ඉතා කෙටි කාලයක් තුළ එම ජනතාවට දැනින.

ඉංග්‍රීසින් තමන්ගේ ගිවිසුම තුළ බුදු සමය ආරක්ෂා කළ යුතු බවට සඳහන් කර තිබුණ ද රදල ප්‍රභූන්ගේ මෙන් ම භික්ෂූන් වහන්සේලාගේ විශ්වාසය දිනා ගැනීමට එය ප්‍රමාණවත් නොවීය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිහසුනෙන් පහකරලීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ ද සහය බ්‍රිතාන්‍යයන්ට ලැබුණ ද ඉන්පසු අනුගමනය කරන ලද ඇතැම් ක්‍රියාමාර්ග තුළ භික්ෂූන් ඉංග්‍රීසින් වෙතින් දුරස්වීමට හේතු විය.

[12] Dolapihilla, P. 1959, ***In the days of Sri Wickramarajasingha, Last king of Kandy***, Maharagama.

[13] බස්නායක, එච්.ටී., 200, 57

ඒ අතර ප්‍රධාන වූයේ මෙරට ස්වදේශික ජනතාව භික්ෂූන් වහන්සේලාට ලබාදුන් ගෞරව සම්ප්‍රයුක්ත බව ඉංග්‍රීසින් විසින් නොලැබීම ය. දළදා වහන්සේ ඉංග්‍රීසින් විසින් යළි මහනුවරට ගෙන ඒමට කටයුතු කළ ද[14], කොබ්බෑකඩුවේ නායක හිමියන් සහ මාවතගම නායක හිමියන් පිළිවෙලින් මල්වත්ත හා අස්ගිරි විහාරයන් හි නායක ධූරයන් ට පත් කළ ද එවැනි ක්‍රියාවන් භික්ෂූන් වහන්සේගේ සිත් දිනාගැනීමට ප්‍රමාණවත් නොවීය. එතෙක් රජු විසින් සියළු විහාරස්ථානයන්ට කරන ලද ප්‍රභූ සත්කාර ඒ ආකාරයෙන් සිදු කරන බවට ඉංග්‍රීසින් පොරොන්දු වුව ද මහනුවර ඉංග්‍රීසි සෙමනේරියන් පිහිටුවීම තුළ එම ප්‍රදේශයට ක්‍රිස්තියානි බලපෑම ඇතිවීම ආරම්භ වූ බව භික්ෂූන් වහන්සේලා විශ්වාස කරන ලදි.

මෙලෙස භික්ෂූන් වහන්සේලා තුළ බ්‍රිතාන්‍යයන් වෙත ගොඩනැගුණු විරෝධය රදළ පිරිස් ඔස්සේ සාමාන්‍ය ජනතාව වෙත යොමු විය. මේ අනුව සාමාන්‍ය ජනතාව තවදුරටත් ඉංග්‍රීසි පාලනයට නොකැමති විය. මෙම තත්ත්වය 1818 මහා කැරැල්ල ඉංග්‍රීසින්ට විරුද්ධව ආරම්භ වීමට පදනම් වූ බව පෙනේ.

## ඉංග්‍රීසීන් අත්පත් කරගත් මෙරට ආර්ථිකය හැසිරවීමේ බලය

මෙම ගිවිසුමේ අවසානයේ දැක්වෙනු ලබන එක් වගන්තියකින් එතෙක් රජු හා ඔහුගේ අධිකාරිලත් නිලධාරින් යටතේ තිබූ රටේ ආර්ථිකය හැසිරවීමේ බලය ඉංග්‍රීසින් තමන් යටතට පූර්ණ වශයෙන් ම පවරාගෙන තිබෙන බව පෙනේ. '**සිංහලෙ රටවල් වල රාජ නියමවල් ද, ආදායම ද, මහා රාජොත්තමයන් වහන්සේගෙ වැඩට සහ මෙ රටේ ආඥාව වර්ධනය වීමට ද යුතු වූ සිරිත් ප්‍රකාර ඉන්ග්‍රීසි ගොවැර්න්නමෙන්තුව වෙනුවෙන් තැබෙන ඒජැන්ට් යන නිළමක්කාර තැනගේ යටතෙ එක්කාසු කරන්ඩ යෙදෙනවා ඇත.**[15]' ඒ අනුව අය කරන ලද බදු මුදල් ඉංග්‍රීසින් විසින් තම රජු වෙනුවෙන් අයකිරීමේ බලය මෙම ගිවිසුමෙන් ලබාගෙන තිබෙන බව පැහැදිළි ය. එය මෙරට පැවති සාම්ප්‍රදායික ආර්ථික ක්‍රියාවලිය කෙරෙහි ප්‍රබල බලපෑමක් එල්ල කිරීමට සමත් වූවක් විය.

වෙළඳාම කෙරෙහි මුල්තැන දීමට ඉංග්‍රීසින් ගත් උත්සාහය මෙම ගිවිසුම තුළින් ද මතු වී පෙනෙන්නකි. එය මෙරට ජනතාවගේ කැමැත්ත සඳහා හේතු වන්නක් වන බව මෙහි සඳහන් කර තිබේ. විශේෂයෙන් ම මෙරට යටත් විජිත පරිපාලනය ඇති වන තෙක් දේශීය වශයෙන් අලෙවි වෙමින් පැවති ඇතැම් වෙළඳ ද්‍රව්‍ය ලන්දේසීන් කළාක් මෙන් ම මෙම ගිවිසුම මගින් විදේශයන්ට අලෙවි කිරීමට සහ විදේශයන්ගේ වෙළඳ භාණ්ඩ මෙරට වෙත ගෙන ඒමට අවශ්‍ය බලයන් මෙම ගිවිසුම මගින් ඉංග්‍රීසින් ලබාගෙන තිබෙන බව '**මේ රටවල් වල වෙළ හෙලදාම් වර්ධන වෙන පිණිස මෙහි උපදින දේ වෙලදාම් පිණිස ගෙන යාම පාසු වෙන හැටියට ද මුදල්, රෙදි එනු නොහොත්**

[14] බස්නායක, එච්.ටී., 200, 57

[15] අබයසිංහ. ටී, දේවරාජ. එස්, සෝමරත්න. ජී.පී.වී., 2015, පි. 163

**සිංහලෙ වැසියො වැඩි කැමති ඇතිවෙන බඩු ඒ පිනිස ගෙන ඒම පාසු කරන ලෙස ද ...............**'[16] යන වගන්ති බණ්ඩයෙන් ආනයන අපනයන අයිතිය ලබාගෙන තිබෙන බව තහවුරු වේ.

උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් ඉංග්‍රීසින් විසින් අනුගමනය කරන ලද බොහෝ ක්‍රියාමාර්ග උඩරැටියන්ගේ කනස්සල්ලට මෙන් ම පසුතැවීමට ද හේතු විය. ඒ අතර ප්‍රධාන වූ කාරණයක් වූයේ ශ්‍රී වික්‍රම රාජසිහ රජු බලයෙන් පහ කිරීමෙන් අනතුරුව නැවත දේශීය පාලනයකට ඉංග්‍රීසින් විසින් අවස්ථාව ලබා නොදීම ය.[17] උඩරට රාජ්‍ය තම පාලනයට නතුකර ගැනීම තුළ බ්‍රිතාන්‍යයන් අපේක්ෂා කරන ලද්දේ ප්‍රදේශ ලාබය පමණක් නොව ඉන් ලබාගත හැකි උපරිම ප්‍රයෝජනය ඉන් නෙලා ගැනීම බව පැහැදිළි ය. මේ හේතුවෙන් උඩරැටියන් එතෙක් පවත්වාගෙන පැමිණි සාම්ප්‍රදායික ජීවන ක්‍රියාවලිය පූර්ණ වශයෙන් ම බිඳ වැටීමට ලක් විය. "**ධනය මෙහි අගයකොට නොසැළකෙයි, එයින් යමෙක් සම්මානීය ද නොවේ**"[18] යනුවෙන් මුදල් ආර්ථිකය සම්බන්ධයෙන් රොබට් නොක්ස් ඉදිරිපත් කර තිබෙන මෙම අදහසින් උඩරට ජනතාව මුදල් පසුපස හඹානොගිය පිරිසක්බව තහවුරු වේ.

උඩරට හා තදාශ්‍රිත ප්‍රදේශවල සාම්ප්‍රදායික ආර්ථික ක්‍රියාවලියේ බිඳ වැටීමට ද ඉංග්‍රීසින් විසින් අනුගමනය කරන ලද මෙම ක්‍රියාවලිය හේතු විය. මහනුවර ප්‍රදේශයේ පරිපාලන කටයුතු කරගෙන යාමට නව දෙපාර්තමේන්තුවක් පිහිටුවීමත්[19] ඒ ඔස්සේ පරිපාලනය පමණක් නොව ආදායම් බදු අයකරගැනීම් වැනි ආර්ථික කටයුතු සිදු කිරීමත් තුළ එතෙක් පැවති රාජාණ්ඩු පාලනයේ පැවැති බලතල අඩු කරමින් නව ක්‍රමවේදයක් තුළ ඉංග්‍රීසින් පාලන කටයුතුවලට මැදිහත්වීම සිදුකර ඇත.

1815 උඩරට ප්‍රකාශය තුළ දැක්වෙන '**රටේ සියළුම ආදායම් ඉංග්‍රීසි රජයට හිමිය**' යන වගන්තිය තුළින් සහ මහනුවර රාජ්‍ය තුළ සියළු වෙළඳ කටයුතු කරගෙන යාම බ්‍රිතාන්‍ය රජයේ නියෝගයන් පරිදි සිදුවිය යුතු ය යන වගන්තීන් මගින්[20] මගින් එතෙක් මෙරට තුළ ක්‍රියාත්මක වූ දේශීය ආර්ථික ක්‍රියාවලිය බ්‍රිතාන්‍යයන්ගේ උවමනාවන් සඳහා හැසිරවීමට බලය ලබාගෙන තිබෙන බව පැහැදිළි ය. ඒ අනුව එතෙක් පැවැති වී වගාව, හේන් වගාව ප්‍රධාන කොටගත් එදිනෙදා පරිභෝජනය සඳහා වන ආහාර නිෂ්පාදනය වෙනුවට ඉංග්‍රීසින් වෙත වැඩි ආදායම් උපදවා ගත හැකි ස්ථිර වැවිලි බෝග වගාවන් සඳහා යොමුවීමේ අදහස මෙම ගිවිසුම සකස් කරන අවස්ථාවේ සිටම ඉංග්‍රීසින් සතුව පැවැති බව තහවුරු වේ.

---

[16] එම. පි. 163
[17] එම. පි. 126-7
[18] Knox, Robert., 1681(Digitized 2009), ***An Historical Relation of the Island Ceylon, in the East Indies***: Together with an Account of the Detaining in Captivity the Author and Divers Other Englishmen Now Living There, and of the Author's Miraculous Escape.
[19] බස්නායක, එච්.ටී., 2005, පි. 52
[20] අබයසිංහ. ටී, දේවරාජ. එස්, සෝමරත්න. ජී.පී.වී., 2015, පි. 163.

උඩරට ජනතාවගේ ස්වාධීනත්වය තවදුරටත් සීමා කිරීමට බ්‍රිතාන්‍යයන් විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගයක් වූයේ එම ප්‍රදේශයේ අධිකරණ කටයුතු ඔවුන් විසින් පවරා ගැනීම ය. උඩරට ගිවිසුමේ දැක්වෙන '**අධිකරණ සංවිධානය රට තුළ පාලන ආයතන මගින් සිදුකළ යුතු ය සහ මහනුවරින් පිට වැසියන්ට එම නීතිය හා අධිකරණ බල නොපැවැත්විය යුතු ය**[21] යන වගන්තිවලින් උඩරට හා තදාශ්‍රිත ජනතාව ඉංග්‍රීසි නීතිය තුළ අධිකරණ ක්‍රියාමාර්ග මගින් සිරකිරීමට ගත් උත්සාහය තහවුරු වේ. රුවන්වැල්ල, බටුගෙදර, කුරුණෑගල සහ රත්නපුරයෙහි අධිකරණ පිහිටුවීම තුළ එම ප්‍රදේශවල ජනතාවට ද නව පාලනය පිළිබඳ ව ඉංග්‍රීසීන් විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග දැනුම් දීමට කටයුතු කර තිබෙන බව හඳුනාගැනීමට පුළුවන.

බ්‍රිතාන්‍යයන්ගේ උඩරට යටත් කර ගැනීම එම ප්‍රදේශවල ජනතාවට කුමන ආකාරයක බලපෑමක් ඇති කරන්නේ ද යන්න සම්බන්ධයෙන් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විමසිල්ලෙන් සිටි බව පෙනේ. උඩරට රජු ඉවත් කිරීමට රදළ නායකයින් මෙන් ම ජනතාව එකඟ වුවද, ඉන් පසු ඇති කෙරෙන නව පාලන ව්‍යුහය සඳහා ඔවුන් කුමන ආකාරයක ප්‍රතිචාරයක් දක්වන්නේ ද යන්න සම්බන්ධයෙන් ඉංග්‍රීසි ප්‍රධානින් තුළ කුතුහලය පැවතින. ඒ සඳහා බලපෑ ප්‍රධාන කාරණයක් වූයේ ස්වදේශික ජනතාව සතු වූ ජාතික, ආගමික හා සංස්කෘතික ක්‍රියාවලිය නව පාලන ක්‍රියාවලිය සමග බද්ධ කරලීමෙහි ලා පැවැති ගැටළුව වේ. මුල් අවස්ථාවේ දී ඉංග්‍රීසින් තම සියළු බලයන් උඩරට ජනතාව වෙත මුදාහරින ලද්දේ යුද්ධමය ශක්තිය මත ඔවුන් බියපත් කරමින් ය යන අදහස ඒ වනවිට ජනතාව තුළ ඇතිවෙමින් තිබිණ.

උඩරට ප්‍රභූ පැළැන්තිය හා ජනතාව සමග ඉංග්‍රීසි ප්‍රධානින් කටයුතු කිරීම හෙවත් උඩරට පාලනය හා ඉංග්‍රීසි පාලනය එකට එකතු කළ නොහැකි අංශ දෙකක් බව උඩරට ඉංග්‍රීසින්ට යටත් වී නොබෝ කළක් ගත වන විට මෙරට ජනතාවට දැනී තිබිණ. රදලවරුන්ට තමන් එතෙක් පවත්වාගෙන පැමිණි සමාජ ගෞරව සම්ප්‍රයුක්ත භාවය වියැකී යාමට ඉඩක් පවතින බව වැටහී යන ලදි.[22] ඒ අනුව උඩරට හා තදාශ්‍රිත ප්‍රදේශයෙහි සෑම පැළැන්තියකම ජනතාව තුළ ඉංග්‍රීසි පාලන තන්ත්‍රයට අකමැත්තක් ගොඩනැගින.

බ්‍රිතාන්‍යයන් ලංකාවේ බලය පූර්ණ වශයෙන් ම අත්පත් කර ගන්නා කාලය වන විට කුඹුරු හා හේන් ගොවිතැන ප්‍රධාන අර්ථ ක්‍රමය වූ මුත් එය ඊට පෙර වියළි කලාපීය ප්‍රදේශ ආශ්‍රිත ව පැවති වාරි ජල සම්පාදනය මගින් සිදුකළ මහා පරිමාණ කෘෂි කාර්මික කටයුතු වලට වඩා වෙනස් වූවක් විය. ඒ වන විට නිසි පරිදි නඩත්තු කටයුතු සිදු නොවීමෙන් එම කලාපයන් හි වාරි කර්මාන්තයන්

[21] අබේසිංහ 2015, පි 163

[22] පීරිස්. රැල්ෆ්., 2001, ***සිංහල සමාජ සංවිධානය***, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

බිඳ වැටී තිබුණු හෙයින් ජනතාවගේ වඩාත් ආකර්ශණීය ප්‍රදේශය වූයේ කඳුකරය හා නිරිතදිග කලාපයයි. එම ප්‍රදේශවල වී ගොවිතැන වර්ෂා ජලය මත පදනම් ව සිදු විය. එමෙන් ම පුළුල් ලෙස විහිදී ගිය තැනිතලා භූමි එම කලාපය ආශ්‍රිත ව පිහිටා නොතිබීම තුළ ඔවුහු වී ගොවිතැන කරන ලද්දේ කඳු අතර වූ පහත් බිම් පදනම් කර ගනිමිනි. මේ නිසා වී ගොවිතැනින් ජනතාවට ලැබුණු ප්‍රයෝජන ඉතා අල්ප විය. මේ හේතුවෙන් ඉංග්‍රීසින්ට ස්වදේශික ජනතාවගේ ගොවිතැන් වලින් ලබාගත හැකි ආදායම ඉතාමත් සීමිත විය. මෙම කාරණය නිසා ඉංග්‍රීසින් වැඩි ආදායම් ලබාගත හැකි විකල්ප ස්ථාවර වගාවන්ට යොමු විය. වෙළඳාම මෙරට ආර්ථික ක්‍රමයක් ලෙස පැවතුණ ද එය මුස්ලිම් ජනතාව අතර වැඩි වශයෙන් ක්‍රියාත්මක වූවක් විය. මිළ මුදල් සීමිත වූ මෙම කාල පරිච්ඡේදයේ දී වෙළඳාම භාණ්ඩ හුවමාරු ක්‍රමය වැඩි වශයෙන් පවත්වාගෙන ගිය බව පැහැදිළි වේ.

බ්‍රිතාන්‍ය පාලනයට මෙරට සමාජය නතුවන අවධියේ දී පැවති අර්ථ ක්‍රමය තුළ රාජකාරි ක්‍රමයට ප්‍රධාන ස්ථානයක් හිමි වී තිබිණ. මෙයින් අදහස් වූයේ රජුට හා රාජ්‍යයට තමාගේ සේවය ලබාදීමට ජනතාවට තිබුණු වගකීම ය. එම කාලයේ දී තමන් පරිහරණය කරන ඉඩකඩම් හා සිදුකරන කාර්යයන් මත පදනම් ව කිසියම් බදු මුදලක් මුදල් වලින් හෝ භාණ්ඩ මගින් රජු විසින් පත් කරන ලද එකතු කිරීමේ නිලධාරින්ට ලබාදීමේ සම්ප්‍රදායක් පැවතිණ. මීට අමතර ව රටේ පවතින විවිධ අවශ්‍යතාවයන් සඳහා තම ශ්‍රමය නොමිලයේ සැපයීමට ද මෙරට ජනතාවට සිදු වී තිබිණ. මෙම රාජකාරි ක්‍රමය ඉංග්‍රීසි පාලන කාලය තුළ ද ක්‍රියාත්මක වූ නමුදු එය පෙර පැවති රටාවට වඩා තරමක් වෙනස් විය. එහිදී ජනතාවට තිබුණු මූලික ගැටළුව වූයේ නොපෙනෙන රජ කෙනෙකු වෙනුවෙන් සේවය කරන්නේ කෙසේ ද යන්න ය.

දුරාතීතයේ සිට පැවති මෙම රාජකාරි ක්‍රමය, ඇතැම් ප්‍රදේශවල සාමූහික කටයුතු සිදු කිරීමේ දී අතිශය වැදගත් විය. හත් කොරළයේ ප්‍රධාන කොටගත් මෙරට වියළි කලාපය ආශ්‍රිත ව පිහිටි පුරාණ වැව් අමුණු යළි ප්‍රතිසංස්කරණය කිරීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව සමයේ දී මෙරට ක්‍රියාත්මක වූ රාජකාරි ක්‍රමය ඉතාමත් ප්‍රයෝජනවත් විය. කෙසේ වෙතත් 1833 දී මෙම රාජකාරි ක්‍රමය බ්‍රිතාන්‍යයන් විසින් අහෝසි කරන ලදි.[23]

මෙරට බ්‍රිතාන්‍ය පාලනයේ ආරම්භක අවධිය තුළ එතෙක් පැවති රාජකාරි ක්‍රමය වැනි නොමිලේ ශ්‍රමය ලබාදීමේ ක්‍රියාවලිය ක්‍රමයෙන් දුර්වල වීම තුළ වෙල්ලස්ස, පහළ ඌව, සත් කෝරළය වැනි ප්‍රදේශවල වාරි කර්මාන්තය ප්‍රබල ලෙස පසුබෑමකට ලක් වී තිබේ. නිසි නඩත්තුවක් නොමැති වීම තුළ එම වාරි කර්මාන්ත සීඝ්‍ර ලෙස බිඳවැටීමට ලක් වී තිබේ. මේ නිසා වාරි කර්මාන්ත පදනම් ව ගොඩ නැගුණු වී වගාව වැනි සාම්ප්‍රදායික කෘෂිකර්මාන්ත කටයුතු පරිහානියට ලක් විය. මේ නිසා තත්කාලීන සමාජයේ ජනතාවට සහල් හිඟයක් ඇති විය. එය මෙරට ජනතාවගේ අර්ථ

[23] බස්නායක, එච්.ටී., 2005, පි. 320

ක්‍රමයට බෙහෙවින්ම බලපාන්නට ඇත. මේ වන විට ලංදේසි පාලන අවධියේ සිටම විදේශයන්ගේ සහල් ආනයනය කොට වෙරලබඩ ප්‍රදේශයේ ජනතාවට ලබාදීම නිසා ඔවුන්ට ආහාර හිඟතාවය ගැටළුවක් නොවී ය.[24] නමුත් මෙම නුහුරු ක්‍රමවේදය එනම් පිටරටින් සහල් ගෙනවුත් පරිබෝජනය කිරීමට උඩරට හා තදාශ්‍රිත ප්‍රදේශවල ජනතාව කැමැත්තක් නොදැක්වීය. මේ හේතුවෙන් මෙම ප්‍රදේශවල ජනතාවගේ සාම්ප්‍රදායික පරිබෝජන රටාව බිඳ වැටීමකට ලක් වී තිබේ. එය තත්කාලීන සමාජයේ ආර්ථිකය බිඳ වැටීමට ප්‍රබල හේතුවක් විය.

උඩරට හා පහතරට ප්‍රදේශ වෙන්කරන ලද සීමාවන් හි පිහිටි කඩවත් වලදී අයකරන ලද කඩවත් බදු 1815 දී ඉවත් කිරීම තුළ මෙරට ප්‍රධානින්ගේ එක් ප්‍රධාන ආදායම් මාර්ගයක් ඇහිරී යන ලදි.[25] මේ නිසා මුදල් ලැබීමේ ක්‍රමවේදයක් අවසන් වීම තුළ ප්‍රාදේශීය රදළ පිරිස් තවදුරටත් කළකිරීමට පත්වූහ.

උඩරට හා තදාශ්‍රිත ප්‍රදේශයන් හි රදළ පිරිස් හා සාමාන්‍ය ජනතාව තුළ පැවතියේ එකම ආකාරයේ අරමුණු බව ටිකිරි අබේසිංහ පෙන්වා දෙයි.[26] නමුත් දෙපිරිසම එකම අර්ථ ක්‍රමයක සාමාජිකයෝ වූහ. කෘෂි කර්මාන්තය ප්‍රධාන කොටගත් මෙම දෙපිරිස සතුවම ඉඩකඩම් පැවතින. රදළ පිරිස්වලට අයත් ගොවිබිම්වල පමණක් නොව තමන්ගේ ද ඉඩකඩම්වල ඔවුහු වගා කටයුතු කරන ලදි. ආරක්ෂාව මෙන් ම අනෙකුත් කාර්යයන් වලදී ද දෙපිරිස අතර පැවතියේ අන්‍යෝන්‍ය සහයෝගීතාවයකි. ඒ අනුව දෙපිරිස අතරම පැවතියේ එක සමාන ආකාරයේ ආර්ථික ක්‍රියාවලියක් බව පැහැදිළි ය.[27] මේ හේතුවෙන් බ්‍රිතාන්‍යයන්ගෙන් එල්ල වූ පීඩනය දෙපිරිසට ම එක හා සමාන ලෙසින් දැනෙන්නට විය. සාම්ප්‍රදායිකව ක්‍රියාත්මක වූ ආර්ථික ක්‍රියාවලිය බිඳ වැටීම දෙපිරිසටම එක හා සමාන ලෙසින් දැනෙන්නට ඇති බව සිතිය හැකි වේ.

බ්‍රිතාන්‍ය ආගමනය තුළ සිංහල ජනතාවගේ ආර්ථිකය බෙහෙවින් දුර්වල වී ගිය අතර වෙළඳාම මත ආර්ථික කටයුතු සිදුකළ මුස්ලිම් ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් වන්නට විය. මුස්ලිම් ජනතාව ඉංග්‍රීසින් සමග සමීපව කටයුතු කොට ඔවුන්ගේ ප්‍රවාහන සහ සේවා සැපයීම ආදී කාර්යයන් ඉටුකරමින් මුදල් ඉපැයීමට සමර්ථකම් දක්වන ලදි. මෙවැනි ක්‍රියාවන් තුළින් මුදල් ඉපැයීම තුළින් මුස්ලිම් ජනතාව ශක්තිමත් වීම කෙතරම් ද යත් ඇතැම් අවස්ථාවල සිංහල බෞද්ධයින් සමග ගැටුම් ද ඇති කරගන්නා ලදි. මෙම තත්ත්වය උඩරට සිංහල ජනතාව නොරිස්සූ කාරණයක් විය.

## බිම් පාළු ප්‍රතිපත්තිය

---

[24] එම. පි 321
[25] සිල්වා. එම්. යූ. ද., 1996, පි 87
[26] අබේසිංහ 2015, පි 131
[27] එම. පි 321

1818 නිදහස් සටන මර්ධනය කරලීම සඳහා බ්‍රිතාන්‍යයන් විසින් දියත් කරන ලද ක්‍රියාමාර්ගය '**දුර්භික්ෂය, අසිපත හා ගිනිදැල්ල**' යන වචන වලින් හැඳින්වී. '**බිම් පාළු ප්‍රතිපත්තිය**' යනුවෙන් ව්‍යවහාර කරන ලද්දේ ද මෙම ක්‍රියාමාර්ගය ම වේ. මෙමගින් බ්‍රිතාන්‍යයන් සිදුකර ඇත්තේ කැරළි පැවති ප්‍රදේශවල ජීවත් වූ ජනතාවගේ නිශ්චල සහ ආර්ථිකය සමග සම්බන්ධ වන අනෙකුත් වංචල දේපළ විනාශ කොට ආර්ථිකය දුර්වල කිරීම ය. ඌව වෙල්ලස්ස ඇතුළු බොහෝ ප්‍රදේශවල නිවාස ගිනි තැබීම, කුඹුරු ඉඩකඩම් පාළු කිරීම, අස්වැන්න පැහැර ගැනීම සහ ගිනි තැබීම, ගවයින් ඇතුළු සතුන් මරා දැමීම, වාරි මාර්ග විනාශ කරලීම වැනි කටයුතු බ්‍රිතාන්‍ය හමුදාව විසින් එම ප්‍රදේශවල ක්‍රියාත්මක වීම තුළ දුර්භික්ෂය පැතිරීම තුළ එම ප්‍රදේශවල සිංහලයින්ගේ ආර්ථිකය පූර්ණ වශයෙන් ම බිඳ වැටිණි.

දිවයිනේ බොහෝ ප්‍රදේශවලට ව්‍යාප්ත වූ 1818 නිදහස් සටන හෙවත් ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙන් ආරම්භ වූ ජනතා නැගිටීම මර්ධනය කරලීම පිණිස එවකට සිටි ආණ්ඩුකාරවර **රොබට් බ්‍රව්න්රිග්** ගේ උපදෙස් පරිදි විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව ඔවුන්ගේ ලිපි සහ ලේඛනවලින් තහවුරු වේ.[28] එය එම කලාපයේ සාම්ප්‍රදායික ආර්ථිකය පූර්ණ වශයෙන් ම විනාශ කරලීමට හේතුවිය. වයස අවුරුදු 18 වැඩි පිරිමි සියළුම දෙනා මරාදැමිය යුතු බවත්, නිවාස ගිණි තබා විනාශකළ යුතු බවත්, ආහාරයට ගතහැකි පළතුරු හටගන්නා සියළු ශාඛ කපා විනාශකර දැමිය යුතු බවත්, සියළුම ධාන්‍ය විනාශ කළ යුතු හෝ රාජ සන්තක කළ යුතු බවත්, වාරි මාර්ග වැව් සහ ඇළ වේලි විනාශ කළ යුතු බවත්, මිනිසුන්ගේ ගවයින් හමුදාවේ අවශ්‍යතාව සඳහා රඳවාගෙන සෙසු සතුන් විනාශ කළ යුතු බවටත් කැරැල්ල මැඩ පැවැත්වීමට යොදා සිටි **මේජර් මැක්ඩොනල්ට** උපදෙස් දී ඇත.[29] ඒ අනුව මැක්ඩොනල්ඩ් කැරැල්ල මැඩ පැවැත්වීමේ අදහසින් ජනතාවට දැඩි දඬුවම් පැනවීම යෝග්‍ය බවට කල්පනා කරන ලද බව තත්කාලීන අත්දැකීම් සහිත වූ **හෙන්රි මාර්ෂල්** පවසා ඇත.[30] ඒ අනුව ජනතාවගේ නිවාස ගිණි තබා විනාශ කරන ලද බවත්, ඔවුන්ගේ ගවයින් සහ ධාන්‍ය ආදිය හේවායන් විසින් ගෙන ගොස් ඉතිරිය විනාශ කරන ලද බවත් ඔහු තවදුරටත් ප්‍රකාශ කර තිබේ.[31] වෙල්ලස්සේ වැසියන් සතුවූ ජවය පාලනය කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් **කර්නල් කැම්බල්** අදහස් දක්වා තිබේ. කැරැල්ල පැවැති කාලයේ දී පොල්ගස් විනාශ කිරීම, විශාල ඇළවේලි කඩා බිඳ කුඹුරු පාළු කිරීම සිදුකර ඇත. ජලය රඳවා

[28] Wimalananda, T., 1970, ***The Great Rebellion of 1818***, Colombo, M.D. Gunasena and Co.

[29] එම.: xlii

[30] Marshall, H., 1846, ***Ceylon; A genaral description of the island and its inhabitants with a historical sketch of the conquest of the colony by the English***, London, William H.Allen and Co, Pp 187-88

[31] එම

ගැනීම සඳහා මෙම බැම් අත්‍යවශ්‍ය බව සඳහන් කරන ඔහු ඒවා අළුත්වැඩියා කිරීමට අවුරුදු ගණනාවක් ගතවිය හැකි බව පෙන්වා දී තිබේ.[32]

## රජයෙන් වැටුප් ලබන සමාජ ස්ථරයක් බිහිවීම

උඩරට නිදහස් සටනේ තවත් එක් ප්‍රතිඵලයක් වූයේ ලංකාව තුළ මාසික වැටුප් ලබන පිරිසක් බිහිවීම ය. ඒ අතර උඩරට දේශීය නිලධාරීන් හා සුළු මුලාදෑනීන් විය. මෙම නිලධාරීන් බ්‍රිතාන්‍ය රජයෙන් ලබා දෙන රැකියාවක් ලෙසින් පත් කිරීමට ද කටයුතු කරන ලදි. මීට අමතර ව ඔවුන්ට බ්‍රිතාන්‍ය රජය වෙනුවෙන් ප්‍රදේශවල බදු එකතු කිරීමේ කටයුතු ද පවරා දී තිබේ. ඔවුන් එකතු කරන බදුවලින් 1/20 කොටසක් ඔවුන්ගේ අයහාරයක් ලෙස නැවත ඔවුන්ට ගෙවා ඇත.[33] මේ හේතුවෙන් සුළු මුලාදෑනින් මුදල් ගැවසෙන පිරිසක් ලෙස සමාජය තුළ පිළිගැනීමට ලක්වීම සිදු වී තිබේ. මේ හේතුවෙන් රජයේ වේතනය මත ආර්ථිකය හසුරුවාගැනීමට කටයුතු කළ පිරිසක් ද ලාංකේය සමාජය තුළ ඇති විය. මෙම තත්ත්වය සාම්ප්‍රදායික ලාංකේය සමාජයට නුහුරු වූවකි. එයට හේතුව වූයේ සාම්ප්‍රදායික ලාංකේය ආර්ථිකය තුළ තමාට පහසු ආකාරයට ආර්ත්‍රිකය හසුරුවා ගැනීමේ හැකියාව තිබුණ ද මෙම නව ක්‍රමය තුළ සාමාජයේ එක් කොටසකට මාසිකව තමන්ට ලැබෙන වැටුප් මුදලට අනුව ආර්ථිකය සකසා ගැනීමට සිදුවිය.

1818 ප්‍රකාශනය අනුව රදළ ප්‍රධානීන්ගේ ආදායම් මාර්ග සහ ඔවුන්ගේ සමාජ තරාතිරම ද අහෝසි කරලීමට ඉංග්‍රීසි ආණ්ඩුව කටයුතු කර තිබේ. රජයේ වැටුප් ලබන ප්‍රධානීන් පිරිසක් ලෙසට ප්‍රධානීන් පත්කිරීම තුළ ඔවුන් වේතන ආර්ථික පදනමක් තුළ කටයුතු කිරීමට ඉඩ සැළැස්වීම තුළ ඔවුන්ගේ සාමාජීය පෞර්ෂය බෙලහීන කිරීමට කටයුතු කර ඇත. පසුකාලීනව විදේශිකයින්ට හා ස්වදේශිකයින් යන දෙපිරිසටම මෙරට ඉඩකඩම් මිළදී ගැනීමට අයිතිවාසිකම් ලබා දුන්න ද ඉංග්‍රීසින්ට ඉඩම් අක්කර 4000 මිළදී ගත හැකිවන විට ස්වදේශිකයින්ට ඒ සඳහා අවසර තිබුණේ අක්කර 100 ඉඩම් ප්‍රමාණයක් මිළදී ගැනීමට පමණි. ඒ අනුව තත්කාලීන ලාංකේය සමාජයේ ඉහළ තත්ත්වයක වැජඹුණු රදළ පිරිස් හා මිළ මුදල් ගැවසුණු දිවයිනේ වෙනත් ප්‍රදේශවල වාසය කළ ස්වදේශිකයින් සුළු ඉඩම් හිමි පිරිස් බවට පත්විය. එය දීර්ඝ කාලයක් පුරා ඔවුන් පවත්වාගෙන පැමිණි සාම්ප්‍රදායික ක්‍රමවේදයට හාත්පස වෙනස්වූවක් විය. මෙය එක් අතකට ස්වදේශික ඇතැම් පිරිස් සඳහා කිසියම් මට්ටමක ආර්ථිකය ශක්තිමත් කිරීමට ප්‍රයෝජනවත් වුවද ඔවුන් සීඝ්‍ර සංවර්ධනයට යෝග්‍ය නොවූවක් විය.

උඩරට රාජධානිය තුළ පැවති අයබදු සහ පුද පඬුරු අය කිරීම බ්‍රිතාන්‍ය රජය මගින් 1818 නොවැම්බර් ප්‍රකාශනයෙන් සම්පූර්ණයෙන් ම අත්හිටුවන ලදි. ලබාගන්නා අස්වැන්නෙන් 1/10 කොටසක් රජයට ගෙවන ලෙස නව බද්දක් පැනවීමට කටයුතු කරන ලදි. කැරැල්ලට සම්බන්ධව රාජ

[32] Campbell, J., 1843, ***Excursions, Adventuies and Field sport in Ceylon.*** Vol. ii, London, T and W Boones.

[33] සිල්වා. එම්. යූ. ද., 1996, පි 99

සන්තක කළ ඉඩම් නැවත සානුකම්පිතව සළකා බලා එම ජනතාවට මුදාහළ අතර එම ඉඩම්වල ආදායම් සඳහා 1/5 බද්දක් අයකරන ලදි.[34] එහෙත් කැරැල්ලට සම්බන්ධ නොවූ ප්‍රදේශ සඳහා එය 1/14 තරම් සුළු කොටසක් විය.[35] කෙසේ වෙතත් මෙම බදු මුදල් සඳහා උඩරට ජනතාව මෙන් ම සෙසු ප්‍රදේශවල ජනතාව ද කැමැත්තක් දැක්වූ බව පෙනී යන්නේ එහි පැවති සරළ තේරුම්ගත හැකි ක්‍රමය තුළ ය.

උඩරට බ්‍රිතාන්‍ය පරිපාලන ව්‍යුහය ශක්තිමත් වීමේ දී ආදායම් පාලන කටයුතු සඳහා ද නිලධාරින් පත් කිරීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා මහනුවර පත් කළ පළමු නිලධාරියා වූයේ සයිමන් සෝවර්ස් මහතා ය.[36] ඩොයිලි මෙම සියළු කටයුතුවල මෙහෙයුම් නිලධාරියා විය. 1816 ඔක්තෝම්බර් මාසයේ දී පිහිටුවනු ලැබූ උඩරට කොමසාරිස් මණ්ඩලය මගින් උඩරට ප්‍රදේශයේ සියළු කටයුතු අධීක්ෂණය සහ පාලනය කිරීමට කටයුතු කිරීම තුළ බ්‍රිතාන්‍යයන් විසින් ඉදිරිපත් කරන ලද ආර්ථික ව්‍යුහය තුළට අකමැත්තෙන් වුවද අනුගත වීමට ස්වදේශීය රදළ ප්‍රධානින්ට මෙන් ම ජනතාවට ද සිදුවිය. 1877 දී බ්‍රවුන්රිග් උඩරට කොමසාරිස් මණ්ඩලයට නිකුත් කළ නියෝගයකට අනුව ආදායම් එක් කිරීම, හිලව් ගෙවීම් ක්‍රම සකස් කිරීම, මුලාදෑනීන්ට වැටුප් ගෙවීම, අනිවාර්ය සේවා හා රාජ්‍ය සේවා ක්‍රියාත්මක කිරීම[37] වැනි ආර්ථිකය හා සම්බන්ධ කාරණා රැසක් පිළිබඳ ව අවධානය යොමු කොට තිබිණ. මෙයින් අපේක්ෂා කරන ලද්දේ උඩරට ප්‍රදේශය ආර්ථික වශයෙන් වඩාත් ප්‍රයෝජනවත් ආකාරයට බ්‍රිතාන්‍යයන්ගේ අරමුණු ඉටුවන පරිදි සකසා ගැනීම ය.

1818 ඉදිරිපත් කළ උඩරට ප්‍රකාශනය මගින් ස්වදේශීය ක්‍රියාවලිය යම් තරමකවත්, බ්‍රිතාන්‍ය ක්‍රමය විශේෂි ලෙසත් සංකලනය වූ පාලන ක්‍රමයක් උඩරට ප්‍රදේශයට හඳුන්වා දෙන ලදි. මෙම ක්‍රමය 1833 දක්වා ව්‍යුහාත්මක වෙනස්කම්වලින් තොරව පවත්වා ගැනීමට හැකිවිය. කෙසේ වෙතත් මේ වන විට උඩරට ප්‍රදේශය කරා පහතරට බලපෑම තදින් සිදුවීම තුළ උඩරට සමාජ සංස්කෘතික ක්ෂේත්‍රයන්ගේ මෙන්ම ආර්ථික ක්ෂේත්‍රයේ ද බලවත් වෙනස්කම් ඇති කරලීමට හේතුවිය.

උඩරට හා තදාශ්‍රිත ප්‍රදේශයන් හි පැවති සාම්ප්‍රදායික ආර්ථික ක්‍රමය වෙනස් කරලීමට බ්‍රිතාන්‍යයන් උත්සහා ගැනීමට ප්‍රධාන හේතුව වූයේ වැඩි වශයෙන් ආදායම් උපදාවගත හැකි ස්ථිර බෝග වගාවන් උඩරට ප්‍රදේශයන්ට හා රටේ සුදුසු දේශගුණික කලාපයන්ට හඳුන්වා දීම ය. ඒ අනුව පැවති ක්‍රම ක්‍රමානුකූලව යටපත් කරලීමට බ්‍රිතාන්‍යයන් කටයුතු කළ බව පෙනේ.

---

34 එම.: 99

35 අබේසිංහ 2015, පි 138

36 සිල්වා. එම්. යූ. ද., 1996, පි 88

37 ***Browning to Bathurst 8 July 1817***. C.O. 54/65

ඇලෙක්සැන්ඩර් ජෝන්ස්ටන්[38] ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් උනන්දු වූ බ්‍රිතාන්‍ය නිලධාරියෙකි. හෙතෙම 1807 දී ආණ්ඩුකාර මේට්ලන්ඩ්ගේ ඉල්ලීම මත ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ආර්ථික, සමාජීය හා දේශපාලන තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිණිස යෝජනාවලියක් සකස් කොට යටත් විජිත භාර ලේකම්වරයාට බාර දී තිබේ.[39] එහිදී නිෂ්පාදන හා වෙළඳාම් ඒකාධිකාරය අහෝසි කිරීමට ජෝන්ස්ටන් යෝජනා කර තිබෙන අතර යුරෝපියානු හා ඉන්දීය ධනවතුන්ට මෙරට ඉඩම් සීමාවක් නොමැතිව මිලදී ගැනීමට අවස්ථාව සළසා දී ඇත.[40]

ජොන්ස්ටන් ඉදිරිපත් කළ යෝජනාවලියේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් යහපත් වූ කරුණු රැසක් විය. රජයේ වැවිලි වගාවන් පුද්ගල සන්තක කිරීම, ගාල්ල, යාපනය හා ත්‍රිකුණාමල වරායන් නිදහස් වෙළඳ වරායන් ලෙස දියුණු කිරීම, රටේ වියළි ප්‍රදේශයන්හි පිහිටි විනාශ වී ගිය වැව් අමුණු යළි පුනරුත්තාපනය කිරීම, කෘෂි කාර්මික සංවර්ධන කටයුතු සඳහා ව්‍යාපාරිකයන්ට අවස්ථාව ලබාදීම, පර්යේෂණ ගොවිපොළ ඇති කිරීම, ලෝකයේ භාවිත කරන කෘෂි කාර්මික උපකරණ රජය මගින් ගෙනවුත් ගොවියන් වෙත ලබාදීම වැනි දේශීය ආර්ථිකය අළුත් මුහුණුවරකින් නගා සිටුවිය හැකි යෝජනාවන් රැසක් විය.[41]

කෝල්බෲක්-කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (1832-34) මෙරටට හඳුන්වා දෙනු ලැබූයේ ඒ වන විට බ්‍රිතාන්‍ය ආණ්ඩුවට ලංකාවේ ආර්ථික තත්ත්ව සම්බන්ධයෙන් පවතින ගැටළු සහගත තත්ත්වයන්ට විසඳුම් ලබාදීමේ අපේක්ෂාවෙනි. ඊට අමතර ව මෙරට පරිපාලන ව්‍යුහය සම්බන්ධයෙන් ද එමගින් අවධානය යොමුකොට ඇත. මෙවැනි ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමේ දී ස්වදේශික ජනතාවගේ විශ්වාසය දිනා ගනිමින් කටයුතු කළ යුතු බවට එවකට සිටි බාන්ස් ආණ්ඩුකාරවරයා යෝජනා කර ඇත. එමගින් රටේ ජනතාවගේ අවශ්‍යතාවන්, ගැටළු පිළිබඳ නිවැරදි තක්සේරුවකට පැමිණිය හැකි බව පෙන්වා දුනි.[42] උඩරට ප්‍රදේශවල මෙන් ම දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල ද ආර්ථිකය නගා සිටුවීම සඳහා විවිධ ක්‍රියා මාර්ග ගෙන තිබිණ. වතු වගාව සාමාන්‍ය ජනතාවගේ ආර්ථිකය වර්ධනය සඳහා සෘජු බලපෑමක් එල්ල නොකරන බව වටහාගත් ෆෙඩ්රික් නෝර්ත්, මේට්ලන්ඩ් වැනි ආණ්ඩුකාරවරුන් වී වගාව සංවර්ධනය සඳහා විවිධ ක්‍රියා මාර්ග ගෙන තිබේ. ධාන්‍ය බීජ හා කෘෂි කාර්මික උපකරණාදිය ණයට ලබාදීමට ඉඩ සැලැස්වීමට මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා තීරණය කරන ලද්දේ කෘෂි කර්මාන්තය දියුණු කරලීම ඔහුගේ අපේක්ෂාව වූ බැවිනි. එම ණය ආපසු ගෙවීමේ දී මුදල් භාවිතයෙන් නොව ධාන්‍ය වලින් ම නැවත ලබාදීමට

[38] Gordons; ***Paper on the Actual Political Condition of Ceylon***. C.O 54/112

[39] ***Memorandum, 30 August 1811*** C.O 54/41

[40] සිල්වා. එම්. යූ. ද., 1996, පි 88

[41] Mendis,.G.C., 1956***, Ceylon Under the British Rule***, Colebrook Cameron Papers, Pp 221-226

[42] සිල්වා. එම්. යූ. ද., 1996, පි 117

අවස්ථාව ලබා දී ඇත.[43] මෙම ක්‍රමවේදය ශ්‍රී ලාංකේය සමාජය තුළ පුරාණයේ සිටම පැවතෙන ක්‍රමයක් වූ බැවින් එයට ස්වදේශික ජනතාවගේ කැමැත්ත හිමිවන්නට ඇත.

නෝර්ත් ආණ්ඩුකාරවරයා අස්වැන්න ඉහළ නංවාලීම විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේ.[44] ඒ අතර එවකට ඉන්දියාවේ ක්‍රියාත්මක වූ පැළ වගා කිරීමේ ක්‍රමවේදයන් සහ වැඩි අස්වැන්නක් ලබාගත හැකි වී වර්ගයන් මෙරටට හඳුන්වා දීමට කටයුතු කර ඇත. ගොවිතැන වර්ධනය කරලීම පිණිස නෝර්ත් ආණ්ඩුකාරවරයා ගොවිතැනින් බදු අයකිරීමේ ක්‍රමවේදය ද සංශෝධනය කර තිබේ. ඒ අනුව ගොඩින් අමුණු 8 ක් ද මඩින් අමුණු 4 ක් ද ගොවිතැන සඳහා වසර පහක කාලයකට බදු රහිතව ලබාදී ඉන් පසු කුඹුරුවලින් ලැබෙන ආදායමින් 1/4 ක් ද, ගොඩ වගාවන්ගෙන් ලද ආදායමින් 1/10 ක් ද බදු වශයෙන් අය කර ගැනීමට කටයුතු කර තිබේ.[45] මෙය ගොවි ජනතාවට වඩාත් සාධාරණ වූ ක්‍රමවේදයක් විය. මෙම ක්‍රියාවලිය තුළ 1832 දී උඩරට කලාපයෙන් අක්කර 7439 ක් ද මුහුදුබඩ කලාපයෙන් අක්කර 54890 ක ප්‍රමාණයක් ද ගොවීන් වෙත ලබාදීමට කටයුතු කර ඇත. ඔහු විසින් අනුගමනය කරන ලද මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් වන්නි, ත්‍රිකුණාමලය, මන්නාරම සහ මඩකලපුව ප්‍රදේශවල වී නිෂ්පාදනය ඉහළ ගොස් ඇත. ඒ අනුව නොක්ස් අනුගමනය කළ එම ක්‍රියාමාර්ගය ප්‍රතිඵලදායක මෙන් ම ජනතාවට වඩාත් හිතකරදායී ක්‍රමයක් බව පෙනේ.

කෘෂි ආර්ථිකය නැංවීම සඳහා නෝර්ත් ආණ්ඩුකාරවරයා සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම පිණිස ක්‍රියාමාර්ග ගෙන ඇත. හෙතෙම මුතුරාජවෙල සංවර්ධනය කිරීමට ගත් උත්සාහය මෙහිදී වැදගත් වේ. තව ද හෙතෙම කුඩැල්ලේ සිට පමුණුගම දක්වා වූ ලන්දේසි ඇළ යළි ප්‍රතිසංස්කරණය කර කුඹුරු වගාව සඳහා ජලය සම්පාදනය කිරීමට ද බලාපොරොත්තු වී තිබේ. 1800 දී නෝර්ත් ආණ්ඩුකාරවරයා මෙරට පැරණි වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම පිණිස යෝජනා ඇතුලත් වාර්තා දෙකක් සකස් කරලීමට කටයුතු කර තිබේ.[46] ඒ අතර හම්බන්තොට මාගම් පත්තුවේ වාරි මාර්ග හා කන්තලේ වැව පිළිබඳ වාර්තාවක් විය.

ලංකාව පිළිබඳ අධ්‍යයනය කළ ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් විශාල වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැදගත්කම රජයට පෙන්වා දුන් අතර ඒ සඳහා යෝජනාවක් ද ඉදිරිපත් කරන ලදි. මඩකලපුව ප්‍රදේශයේ පිහිටි සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය සාර්ථක වූ බව සනාථ වන්නේ එම ප්‍රදේශයේ වී අස්වැන්න ඉහළ ගිය බවට වාර්තා වීමය. කෙසේ වෙතත් 1818 කැරැල්ලේ

[43] බස්නායක, එච්.ටී., 2005, පි. 322

[44] එම

[45] එම

[46] Brohier, R.L., 1934, ***Ancient Irrigation Works in Ceylon***. Part i-iii. Colombo, Ministry of Mahaweli Development.

ප්‍රතිඵලයක් ලෙස පහළ ඌව හා වෙල්ලස්ස කලාපයේ සක්‍රීය ව පැවැති සුළු වාරි කර්මාන්ත විනාශ කරලීමට ඉංග්‍රීසි හමුදා කටයුතු කරලීම නිසා එම ප්‍රදේශවල කුඹුරු වගාව දිග කාලයක් යන තෙක් සාර්ථක වූ බවක් නොපෙනේ.

කැරැල්ලේ පසු කාලය තුළදී නැවත වාරි මාර්ග කටයුතු සංවර්ධනයට බ්‍රිතාන්‍ය රජය කටයුතු කර ඇත්තේ එමගින් ලැබෙන දිගුකාලීන ප්‍රයෝජනය නිසා බව පැහැදිළි ය. ***එඩ්වඩ් බාන්ස්*** (1820-24) ආණ්ඩුකාරවරයාගේ කාලයේ දී දකුණු පළාතේ කිරම වැව හා ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කරලීම මෙයට නිදසුනකි.[47]

මෙරට පැවති සාම්ප්‍රදායික කුඹුරු ගොවිතැන වර්ධනය කරලීමට විවිධ ක්‍රියාමාර්ග ගමින් සිටින අතර බ්‍රිතාන්‍ය රජය ස්ථිර බෝග වගාවන් සඳහා දිරිදීමට ද කටයුතු කර තිබේ. එහෙත් මෙම කාර්යය උඩරට ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමට අසීරු විය. ස්ථිර බෝග අතර ආරම්භක අවධියේ දී ප්‍රධාන වූයේ කුරුඳු වගාව ය. කෙසේ වෙතත් සලාගම් කුළයේ ජනතාව අතරට රාජකාරි ක්‍රමයට අනිවාර්යය කර තිබූ කුරුඳු තැලීම කෝල්බෲක් යෝජනා මගින් රාජකාරි ක්‍රමයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලදි.

ලංකාවේ බ්‍රිතාන්‍ය රජය රටේ ආර්ථිකය වර්ධනය කරලීම සඳහා විවිධාකාර වෙළඳ කටයුතුවල නිරතවී ඇත. ඒ අතර ඉංග්‍රීසින් මෙරට යටත් කරගත් මුල් අවස්ථාවේ සිට දශක දෙකක පමණ කාලයක් මුතු කිමිදීම මගින් සැළකිය යුතු ආදායම් ලැබී ය. ලුණු නිෂ්පාදනයෙන් ද රජය ආදායමක් ලැබී ය. එහිදී ලුණු ලේවායන් අවට පිහිටි ගම්මානවල ජනතාවට ලුණු එකතු කිරීමේ කාර්යය පවරා ඉන් ලැබෙන ආදායමින් කොටසක් එම ගම්වැසියන්ට ලබාදී ඇත.[48] එහෙත් පසුව එහි ඒකාධිකාරීත්වය රජය විසින් ලබාගෙන තිබේ.

ශ්‍රී ලාංකේය ජනතාවගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස ඉංග්‍රීසින් මෙරට යටත් කරගත් පසු දශක කිහිපයක් යන තෙක් වෙළඳාම පැවතිණ. වෙළඳාම සඳහා පොල් නිෂ්පාදනය පුවක්, කෝපි, ගම්මිරිස්, කරඳමුංගු, දුම්කොළ ආදිය බහුල වශයෙන් යොදා ගැනින. පොල් නිෂ්පාදනය අතර අරක්කු, කොප්පරා, කොහු, පොල් තෙල් ආදිය විය. දකුණු පළාතේ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල මුහුදුබඩ කලාපයේ ජනතාවට කොහු ලණුවලින් ආදායමක් ඉපැයීමට එම කාලයේ දී හැකි විය. මෙවැනි කටයුතු නිසා ජනතාව අතර යම් තරමකින් මිල මුදල් ගැවසීමට පටන් ගැනින. විශේෂයෙන් ම කුරුඳු නිෂ්පාදනය සමග සම්බන්ධ වූ සලාගම් කුලයේ ජනතාව අතර වැඩි වශයෙන් මුදල් භාවිතය විය.

[47] බස්නායක, එච්.ටී., 2005, පි. 330
[48] Brohier, R.L., 1934

බ්‍රිතාන්‍යයන් මෙරට ආරම්භ කළ වැවිලි ව්‍යාපාර අතරින් මුල් අවධියේ දී කෝපි වගාවට ප්‍රධාන ස්ථානයක් හිමි විය. එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයාගේ සිටම කෝපි වගාව ක්‍රමයෙන් දියුණු වූ අතර ***විලියම් ග්‍රෙගරි*** (1872-77) ආණ්ඩුකාරවරයාගේ කාලය එහි ස්වර්ණමය අවධිය ලෙස සැළකේ. කෝපි වගාව පදනම් කරගනිමින් විවිධ සේවා සැපයීම ආරම්භ වීම නිසා විවිධ ක්ෂේත්‍රවල කටයුතු කළ පිරිස් සඳහා නව ආදායම් මාර්ග විවෘත විය. මේ හේතුවෙන් මුදල් අතැති දේශීය සමාජ ස්ථරයන් මෙරට ගොඩනැගින. මෙය මෙරට මධ්‍යම පාන්තියේ ආරම්භය ලෙස සැළකිය හැකි වේ.

කෝපි වගාව දේශීය ජනතාව තුළ පැවති ඉඩම් පිළිබඳ අයිතිය අහිමිවීමට හේතුවක් විය. විශේෂයෙන් ම කෝපි වගාවට යෝග්‍ය වූ කඳුකර ප්‍රදේශයේ ගැමි ජනතාව සතුව පැවැති ඉඩකඩම් ද මේ යටතේ පවරා ගැනීමට කටයුතු කරන ලදි. මේ හේතුවෙන් විශාල වශයෙන් ඉඩකඩම් සහිත හා ඉඩකඩම් අහිමිවී ගිය වශයෙන් දෙපිරිසක් උඩරට ප්‍රදේශයේ බිහිවිය. මේ හේතුවෙන් දීර්ඝ කාලයක් පුරා උඩරට පැවති වැඩවසම් ආර්ථික ක්‍රියාවලිය බිඳ වැටීමට පටන් ගැනින. මෙම කාලය තුළ උඩරට ආර්ථිකය තුළ ලක්ෂණ දෙකක් පැවති බව බස්නායක පෙන්වා දී ඇත. එනම් වතු වැවිලි හා වාණිජ ආර්ථිකයන් කෘෂි කර්මය හා බෝග වගාව පදනම් කරගත් ග්‍රාමීය ආර්ථිකය යන අංශ දෙක ය.[49]

ඉංග්‍රීසි රජය ආදායම් ලබාගැනීම සඳහා අයකළ විවිධ බදුවර්ග මෙරට ජනතාවගේ ආර්ථිකය සඳහා බෙහෙවින් බලපාන ලදි. වී සඳහා බදු අය කරන ලද්දේ වී බද්දේ ලේකම් හෝ වී බද්දේ මුහන්දිරම් විසිනි. උඩරට ප්‍රදේශවල බදු එකතුකරන ලද මුලාදෑනීන්ට 5%-10% කොමිස් මුදලක් ලබාදී ඔවුන් දිරිමත් කිරීමට පියවර ගෙන තිබිණ.[50] ඇඟ බදු ක්‍රමය ජනතාව පීඩාවට පත් කරවන්නක් විය. නෙලා ගනු ලබන මාළු අස්වැන්නෙන් 1/10 ප්‍රමාණයක් බදු වශයෙන් අය කරගෙන ඇත. ගස් කැපීමේ දී කපන ලද ගස්වලින් 1/10 බද්දක් අයකරගෙන තිබේ. පොල් නිෂ්පාදනවලින් ද බදු අයකර ගැනීමට කටයුතු කෙරින.

සිංහල සමාජ සංවිධානය තුළ 1820 පමණ කාලයේ දී ද කුඹුරු වගාවේදී සහයෝගයෙන් සාමූහිකව කටයුතු කළ යුතු විය. 1829 ඔක්තෝම්බර් මාසයේ දී ජෝර්ජ් ටර්නර් විසින් ඉදිරිපත් කළ ලිපියකට අනුව අයිතිකරුවන් ගණනාවක් සිටින වෙල් යායක වැඩ කටයුතු කිරීමේ දී සියළුම කාර්යයන් සඳහා එම හිමිකරුවන් සියළු දෙනාම සම්බන්ධ විය යුතු බව සඳහන් කර ඇත. කුඹුරු යායට ජලය සපයන ඇළ මාර්ග සුද්ධ පවිත්‍ර කිරීමේදී එම සියළු දෙනාම සහභාගි විය යුතු අතර කිසියම් කෙනෙකු සහභාගි නොවුනි නම් ඔහුගේ කුඹුරට ජලය නොසපයා එය විනාශ වී හැරීමට අන් අය කටයුතු කරනු ලබන බව දැක්වේ. කුඹුරු බිම වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා එය වටා සිටුවනු ලබන වැට සඳහා වගා කරනු ලබන එක් එක් කුඹුරුවල විශාලත්වයට අනුව කණු ප්‍රමාණයක් ලබාදීමට කුඹුරු හිමියන් බැඳී සිටින අතර සම්පූර්ණ කුඹුරු යාය ආවරණය වන සේ

[49] බස්නායක, එච්.ටී., 2005, පි. 336
[50] එම. 340

බඳිනු ලබන වැට ඇහැරීම සඳහා සහභාගිවීම අනිවාර්යය වේ. එය පැහැර හැරීම සාමූහිකත්වය කඩකිරීම තුළ තරවටු කිරීම්වලට හෝ ප්‍රධානීන්ට පැමිණිලි කර බලෙන් වැට ගැනීමට ද හැකියාව පැවති බව සඳහන් කොට ඇත.[51] මෙම කරුණු වලින් පැහැදිළි වන්නේ 1818 විමුක්ති කැරැල්ලෙන් පසුව වුවද සාම්ප්‍රදායික ක්‍රමවේදයන් යම් තරමක් ක්‍රියාත්මක වූ බව ය. සාම්ප්‍රදායික ආර්ථ ක්‍රමයක් වූ වී ගොවිතැන තුළ සාමූහිකත්වයට වැදගත් තැනක් හිමිවූ බව ඉන් තහවුරු වේ.

හෙන්රි මාෂල් පවසා තිබෙන පරිදි 'කිසියම් රජයක් සාධාරණ හා යුක්ති සහගතවීම පමණක් ප්‍රමාණවත් නොවේ. එය ජනතාවට පහසුවෙන් අවබෝධකර ගතහැකි වීම ද අත්‍යාවශ්‍ය වේ.[52] ජෝන් ඬේවි ප්‍රකාශ කර ඇත්තේ ස්වදේශිකයින් හා ඉංග්‍රීසින් වන ඔවුන් අතර එක්වීමට තරම් කිසිදු සුදුසුකමක් නොතිබුණ මුත් දුරස්කිරීම්වලට හේතුවන කාරණා උපරිම ලෙස පැවති බවයි[53] ඉංග්‍රීසින් හා ස්වදේශිකයින් අතර පැවැති නොගැලපෙන බව උඩරට රදළ ප්‍රධානියෙකු විසින් ප්‍රකාශ කරන ලද එක නගුලකට බඳින ලද වී ගොනෙකුට හා එළ ගොනෙකුට සමාන බව ප්‍රකාශ කර තිබේ. දේශීය හා විදේශීය මෙම අදහස්වලින් තහවුරු වන්නේ ඉංග්‍රීසින්ගේ සියළුම ක්‍රියාවන් මෙරට ජනතාව විශේෂයෙන් උඩරට ජනතාව විසින් නොරිස්සූ බව ය. දීර්ඝ කාලයක් පුරා මෙරට ජනතාවට හුරු වී පැවැති සමාජ, දේශපාලන, ආගමික හා ආර්ථික ක්‍රියාවලින්ට ප්‍රතිවිරුද්ධ මත දැරීම තුළ ඉංග්‍රීසිහු සමග ස්වදේශික ජනතාව සම්බන්ධ වීමට නොකමැත්තක් දැක්වූහ. දිගු කලක් පුරා පවත්වාගෙන ආ සාම්ප්‍රදායික ආර්ථික ක්‍රියාවලිය වෙනස් කරලීමට ඉංග්‍රීසින් කටයුතු කිරීම ඔවුන්ට තදින්ම දැනින.

1818 විමුක්ති කැරැල්ලේ දී ඉංග්‍රීසින් අනුගමනය කරන ලද බිම් පාළු ප්‍රතිපත්තිය තුළ ඉතා පහසුවෙන් කැරැල්ල මර්ධනය කරලීමට ඉංග්‍රීසින් යටත් විය. එහෙත් සටන පැවති ප්‍රදේශවල ඔවුන් විසින් සිදුකරන ලද භෞතික සම්පත් හා පාරිසරික සම්පත් විනාශය ඉන්පසු සියවසක් ගතවන තෙක් ම යථා තත්ත්වයට පත්කරලීමට නොහැකි තරම් දරුණු ක්‍රියාමාර්ග විය. බිඳ වැටී ගිය ග්‍රාමීය සාම්ප්‍රදායික ආර්ථිකය යළි ප්‍රතිසංස්කරණය කරගැනීමට ඇතැම් විට ඉංග්‍රීසි ආණ්ඩුවට පසුකාලීනව සහාය දුන්න ද එය ප්‍රතිඵල රහිත ක්‍රියාමාර්ගයක් බවට පෙන්නුම් කරන පරිද්දෙන් විනාශකාරී වූවක් විය. මේ හේතුවෙන් උඩරට ග්‍රාමීය ජනතාවට මේ වන විට පහතරට හා මුහුදුබඩ කලාපවල සහ සතර කෝරළයෙන් පහළ ප්‍රදේශවල ජනතාව හුරුවී සිටි මිශ්‍ර ආර්ථික ක්‍රියාවලියට අවතීර්ණ වීමට සිදු විය. ඒ අනුව සාම්ප්‍රදායික වගා කටයුතු යම්තාක් දුරට සිදුකරන අතර තුර විකල්ප ආර්ථික ක්‍රියාමාර්ගයන්ට යොමුවීම සිදුවී තිබේ.

51 ඩොයිලි. ජේ.ඇම්., 2005. ***සිංහලේ ආණ්ඩු ක්‍රමය පිළිබඳ ලුහුඬු සටහන්***, පරි. එච්. ඇම්. සෝමරත්න, පිට 212

52 Marshall , H. ***Ceylon - A General Description of the Island and its Inhabitants***. Pepr. Kandy P 136

53 Devy. Johon - ***An Acount of the Interior of Ceylon its habitants***, London. 1821. P 14.

1818 නිදහස් සටන සඳහා ආර්ථික සාධක ප්‍රධාන වූවා සේම 1848 නිදහස් සටන උදෙසා ද ආර්ථික සාධක මූලික විය. ඒ අතර ටොරින්ටන් ආණ්ඩුකාරවරයා විසින් පනවන ලද නව බදු ප්‍රධාන හේතුවක් විය. ඇතැමුන් පෙන්වා දෙන්නේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටත් රටේ ආර්ථිකය නංවාලීමට කෝල්බෲක් -කැමරන් විසින් ඉදිරිපත් කළ ඇතැම් යෝජනාවන් ද මේ සඳහා බලපා තිබෙන බවකි.[54]

## සමාලෝචනය

උඩරට පාලනය බ්‍රිතාන්‍යයන් විසින් පවරාගන්නා  අවස්ථාව වනවිට උඩරට සහ තදාශ්‍රිත ප්‍රදේශවල ජනතාව සවයංපෝෂිත සමාජයක් තුළ සන්තෘෂ්ටිකර ජීවිතයක් ගෙවූ පිරිසක් විය. "***උඩරට සිංහලයෝ තෘප්තිකර සභ්‍යත්වයක් සහ කලාවක් ද, වැසියන්ගේ ආගම වූ රාජ්‍යාගමක් ද ඇති අවශ්‍ය හැමදෙයින් සමෘද්ධ නිදහස් මනුෂ්‍ය වර්ගයක් වූහ***" යනුවෙන් ආනන්ද කුමාරස්වාමි පවසා ඇත්තේ එය සත්‍යයක් වූ බැවිණි.[55] බ්‍රිතාන්‍ය පාලනයට මෙරට පූර්ණ වශයෙන් ම යටත්වීමෙන් පසු මෙරට ජනතාවගේ ආර්ථික ක්‍රියාවලිය මූලික කරගත් සාම්ප්‍රදායික අඛණ්ඩ ජීවන ගලනයට විවිධ බාධා එල්ලවීම තුළ ඔවුන් ඉංග්‍රීසි පාලනයට  විරුද්ධ වූ අතර එම ජාතික නිදහස් සටන් ව්‍යාපාර ඇරඹුණේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. මෙරට බ්‍රිතාන්‍ය පාලනය ස්ථාවර කරගත් පසු ඔවුන් විසින් බිඳ දමන ලද සාම්ප්‍රදායික ග්‍රාමීය ආර්ථික ක්‍රියාවලිය යළි ප්‍රතිසංස්කරණය කරගැනීමට ඉංග්‍රීසි ආණ්ඩුවට පසුකාලීනව සහාය දුන්න ද එය ප්‍රතිඵල රහිත ක්‍රියාමාර්ගයක් බවට පත්වී තිබේ. මේ හේතුවෙන් උඩරට ග්‍රාමීය ජනතාවට මේ වන විට පහතරට හා මුහුදුබඩ කලාපවල සහ සතර කෝරළයෙන් පහළ ප්‍රදේශවල ජනතාව හුරුවී සිටි මිශ්‍ර ආර්ථික ක්‍රියාවලියට අවතීර්ණ වීමට අකමැත්තෙන් වුවද සිදුවී ඇත. ඒ අනුව සාම්ප්‍රදායික වගා කටයුතු යම්තාක් දුරට සිදුකරන අතර තුර විකල්ප ආර්ථික ක්‍රියාමාර්ගයන්ට යොමුවීම හඳුනාගත හැකි ය.

[54] ඇඳගම. එම්., 2012. ***යටත් විජිතවාදයේ ව්‍යාප්තිය හා ස්වදේශීය ප්‍රතික්‍රියා 1815-1850***, ශ්‍රී ලාංකේය ඉතිහාසය කාණ්ඩය IV- ගුණසේන සහ සමාගම කොළඹ. පිට 134.

[55] කුමාරස්වාමි. ඒ. කේ., 1962, ***මධ්‍ය කාලීන සිංහල කලා***, පරි. එච්. ඇම්. සෝමරත්න, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ, පි. 15